## සාමාන්‍ය සමය දසසතරවන ඉරුදින | දේව ප්‍රකාශන

05-07-15

## පළමුවන දේව ප්‍රකාශනය

එසෙකියෙල් 2:2-5

එසෙකියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**("ඔවුන් කැරළිකාරයන් වුවත් දේව පණිවුඩය දැනගන්නෝ ම ය.")**

උන් වහන්සේ මට කතා කළ විට, දේවාත්මානුභාවය මා තුළට ඇතුල් වී මා නැගිටුවා සිටෙව්වේ ය. මට කතා කළ තැනන් වහන්සේගේ හඬ මට ඇසුණේ ය. උන් වහන්සේ මෙසේ වදාළ සේක. "මනුෂ්‍ය පුත්‍රය, මට විරුද්ධව කැරළි ගැසූ, කැරළිකාර ජාතියක් වන ඉශ්රායෙල්වරුන් වෙත මම නුඹ යවමි. ඔව්හු ද ඔවුන්ගේ පියවරු ද අද දවස දක්වා මට විරුද්ධව ද්‍රෝහිකම් කළහ. ඒ සෙනග මුරන්ඩු දැඩි සිත් ඇත්තෝ වෙති. මම ඔවුන් වෙත නුඹ යවමි. නුඹ ද, "මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේකැ"යි ඔවුන්ට කියන්න. ඔවුන් කැරළිකාර මනුෂ්‍යයන් වන බැවින් සවන් දුන්නත්, නුදුන්නත් ඔවුන් අතරෙහි දිවැස්වරයෙකු සිටින බව ඔවුන් දැනගනු ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 123:1-4

පිළිතුර: සමිඳුනි, ඔබ දෙස අපගේ දෙනෙත් ඔසවමු.

ගීය: සග ලොව වැඩ වසන සමිඳුනි, ඔබ දෙස මාගේ ඇස් ඔසවමි. බලව දාසයකුගේ ඇස් සිය ස්වාමියාගේ අත දෙසත්, දාසියකගේ ඇස් සිය ස්වාමිදුවගේ අත දෙසත්, යොමු වී තිබෙන්නාක් මෙන්, අපේ දෙවිඳාණන්ගේ කරුණාව අප වෙත පහළ වන තෙක් අපේ දෑස එතුමාණන් දෙස යොමා තිබේ.

සමිඳුනි, අපට කරුණා කළ මැනව. අපට කරුණා කළ මැනව. මන්ද, අපි අධික ලෙස නින්දාවට ලක් වී සිටියෙමු.

සුව පහසු ලබමින් සිටින අයගේ උපහාසයටත් අහංකාරින්ගේ නින්දාවටත් අපි බොහෝ කල් ලක් වී සිටියෙමු.

## දෙවන දේව ප්‍රකාශනය

2 කොරින්ති 12:7-10

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**("ක්‍රිස්තුන් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස,
මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි.")**

ඒ එළිදරව් කිරීම්වල අති උතුම්කම කරණකොටගෙන, මා හිස උදුම්මා නොගන්නා පිණිස, මට පහර දීමට සාතන්ගේ දූතයෙකු වැනි, ශරීරයේ කාවැදුණු කටුවක් හා සමාන පීඩාවක් මට දෙන ලද්දේ ය. එසේ වූයේ මා හිස උදුම්මා නොගන්නා පිණිස ය. එය ඉවත් කරන මෙන් තුන් වරක් මම සමිඳාණන් වහන්සේගෙන් ඉල්ලුවෙමි. උන් වහන්සේ පිළිතුරු දෙමින්, "මාගේ බලය පරිපූර්ණ වන්නේ දුර්වලකමේ දී බැවින්, මාගේ වරප්‍රසාදය ඔබට සෑහේ"යයි වදාළ සේක. එබැවින් ක්‍රිස්තුන් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස, මාගේ

දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුන් වහන්සේ උදෙසා පැමිණෙන දුර්වල-කම් ද අන්තරා ද අගහිඟකම් ද පීඩා ද විපත්ති ද මම සතුටින් පිළිගනිමි. මක්නිසා ද යත්, දුර්වල ව සිටිය දී ම මම ශක්තිසම්පන්න ව සිටිමි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහාන් 1:14,12 හෝ ලූක් 4:18

ආලේලූයා! ආලේලූයා!

ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක. උන්වහන්සේ අදහාගත් අයට, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන්වහන්සේ දෙවා වදළ සේක.

හෝ

"සමිඳුණන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසා ද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන් වහන්සේ මා ආලේප කළ සේක."

ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 6:1-6

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("දිවැසිවරයෙකුට ගරු බුහුමන් නැත්තේ සිය ගමේ දී පමණ ය")**

ජේසුස් වහන්සේ එතැනින් නික්ම සිය රටට පැමිණි සේක. ශ්‍රාවකයෝ ද උන් වහන්සේ පිරිවරා ගියහ. එය සබත් දින වූයෙන් උන් වහන්සේ ධර්මශාලාවෙහි උගන්වන්න පටන්ගත් සේක. උන් වහන්සේට සවන් දුන් සමූහයා විස්මිත ව, "මොහුට මේ දේවල් පහළ වූයේ කොහෙන් ද? මොහුට දී තිබෙන මේ ප්‍රඥාව කිමෙක් ද? මොහු අතින් කරනු ලබන හාස්කම් කවරේ ද? මොහු වඩුවා නොවේ ද? මරියාගේ පුතා නොවේ ද? ජාකොබ්, ජෝසෙප්, ජූදස් හා සීමොන් යන අයගේ සහෝදරයා නොවේ ද? මොහුගේ සහෝදරියනුත් අප අතර සිටිනවා නොවේ ද?" කියා ඔව්හු උන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. ජේසුස් වහන්සේ කතා කරමින්, "දිවැසිවරයෙකුට ගරුබුහුමන් නැත්තේ සිය ගමේ දීත්, නෑදෑයන් අතර දීත්, තම ගෙදර දීත් පමණකැ"යි වදාළ සේක. එහි දී රෝගීන් ස්වල්ප දෙනෙකු පිට අත් තබා සුව කිරීම හැර, අන් කිසි හාස්කමක් කරන්න උන් වහන්සේට නොහැකි විය. ඔවුන්ගේ අවිශ්වාසය ගැන උන් වහන්සේ මවිත වූ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.